**ශීර්ෂය 193 - කම්කරු අමාත්‍යාංශය**

**----------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**--------------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

**-----------------------------**

කම්කරු අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කම්කරු අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 ජුනි 22 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 අගෝස්තු 24 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට කම්කරු අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**--------------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

**--------------------------------------------------------------------------------------------**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) පහත සඳහන් නිරීක්ෂණය හැර මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට , මූල්‍ය තත්ත්වය ප්‍රකාශයේ පූර්ව වර්ෂයේ අවසාන ශේෂ මෙම වර්ෂයේ සංසන්දනාත්මක සංඛ්‍යා ලෙස ඉදිරිපත් කිරීමේදී පූර්ව වර්ෂයේ පැවති ශේෂවලට,ජාතික එලදායිතා ලේකම් කාර්යාලයෙන් වර්ෂය තුළදී පවරා ගන්නා ලද ශේෂ ද එකතු කර තිබූ නමුත් මේ පිළිබඳව මූල්‍ය ප්‍රකාශ සඳහා වූ සටහන් මගින් හෙළිදරව් කර නොතිබුණි.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-----------------------------------

### 1.6.1 දේපල පිරියත හා උපකරණ

--------------------------

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම්වල ශේෂය රු.582,687,237 ක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දක්වා තිබුණද, මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයට අනුව එය රු.647,939,499 ක් වීමෙන් ආරම්භක ශේෂයන්ගේ රු.65,252,262 ක වෙනසක් නිරීක්ෂණය විය. මෙම වෙනසට හේතුව ගිණුම් සටහනක් මගින් හෝ අනාවරණය කර නොතිබුණි. | මෙම වටිනාකම 2020 වර්ෂයේදී ද පෙන්වා දුන් පරිදි ජාතික එලදායිතා ලේකම් කාර්යාලයට අදාලව, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයෙන් පවරා දී ඇති වත්කම් වල වටිනාකමයි. මෙම වටිනාකම ගිණුම් සටහන් මගින් අනාවරණය කිරීමට නොහැකිවූ බව පිළිගනිමි. | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ මගපෙන්වීම්වලට අනුකූලව භාණ්ඩාගාර ගිණුම්වලට අනුකූලවන පරිදි හැකිතාක් නිවැරදිව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කලයුතු වීම. |
| (ආ) | 2021 වර්ෂයේදී ජාතික එලදායිතා ලේකම් කාර්යාලය සඳහා ආසියානු එලදායිතා සංවිධානය මගින් ආධාර වශයෙන් ලබාදී තිබූ USD 20,000 ක පරිගණක උපාංග විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හරහා ලබාගෙන නොතිබුණු අතර මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයටද ඇතුලත් කර නොතිබුණි. | ආසියානු එලදායිතා සංවිධානය මගින් ලබා දුන් ඇ.එ.ඩො.20,000 ක ආධාර මුදල උපයෝගි කොට ගෙන මිලදී ගනු ලැබූ ප්‍රාග්ධන භාණ්ඩ 2021 නොවැම්බර් 24 දින වන විට ජාතික එලදායිතා ලේකම් කාර්යාලය වෙත ලැබී ඇත. ඒ අනුව ප්‍රාග්ධන ලේඛනයෙහි එය සටහන් කර ඇතත් CIGAS ගිණුම් පද්ධතියෙහි එය යාවත්කාලීන කර ඇත්තේ | විදේශාධාර ලබාදීමේදී මුදල් රෙගුලාසි අනුව හා රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 30/94 අනුව කටයුතු කලයුතු අතර ස්ථාවර වත්කම් නිවැරදිව ගිණුම් තැබීමට කටයුතු කලයුතුය. |

| | | | |
|---|---|---|---|
| | | 2022 වර්ෂයේදි බැවින් කලින් ඉදිරිපත් කරන ලද වාර්තාව තුළ එම අයිතමයන් සටහන් වී නොමැත. නමුත් මේ වන විට CIGAS ගිණුම් පද්ධතියෙහි එය යාවත්කාලින කර ඇත. | |
| (ඇ) | මූල්‍ය ප්‍රකාශනවල ACA-6 ආකෘතිය මගින් ඉදිරිපත් කර තිබූ මූල්‍ය නොවන වත්කම්වල වටිනාකම් රු.633,226,812 හා විගණනයට ඉදිරිපත් කර තිබූ තොරතුරු අනුව මූල්‍ය නොවන වත්කම්වල වටිනාකම රු.575,624,796 වීමෙන් රු.57,602,016 ක වෙනසක් නිරීක්ෂණය විය. මේ අනුව 2021 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි මුළු වත්කම් එම ප්‍රමාණයෙන් අධිගණනය වී තිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල ACA – 6 ආකෘති මගින් ඉදිරිපත් කර තිබූ මූල්‍ය නොවන වත්කම්හි වටිනාකම්වල වෙනසක් නිරීක්ෂණය වීමට හේතු වී ඇත්තේ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශ පිළියෙල කිරීමේදී ජාතික වලදායිතා ලේකම් කාර්යාලය කම්කරු අමාත්‍යාංශ ශීර්ෂ 193 යටතේ ක්‍රියාත්මක වූ අවසන් කාලපරිච්ඡේදයට අදාලව පමණක් නොව එම කාර්යාලය රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශ ශීර්ෂ 130 යටතේ ක්‍රියාත්මක වූ මුල් කාල පරිච්ඡේදයට අදාලව 6000-13-045 හා 6000-18-033 අංක දරන තැන්පත් ගිණුම් හරහා ගිණුම්ගත වූ කොටස් ද ඇතුලත් වූ බැවිණි. කෙසේ වුවද, ශේෂ පවරා ගැනීම් ගිණුම්ගත කිරීමේ දී අයවැය චක්‍රලේඛ මගින් දී ඇති උපදෙස් පරිදි ක්‍රියාත්මක කර ඇති බව පෙන්වා දෙනු කැමැත්තෙමි. | ස්ථාවර වත්කම් නිවැරදිව ගිණුම්ගත කර ස්ථාවර වත්කම් ලේඛණය යාවත්කාලීනව පවත්වා ගතයුතු වීම. |

### 1.6.2 නොසැසඳුනු ශේෂයන්

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| විගණනයට ඉදිරිපත් කරන ලද කම්කරු අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනට ශේෂ පිරික්සුමට වර්ෂය තුලදී භාණ්ඩාගාරයෙන් ලැබී තිබූ රු.709,243,000 ක් ඇතුලත් කර නොතිබුණු අතර ශේෂ පිරික්සුමට ඇතුලත් කර තිබූ 249/21 අග්‍රිම ගිණුමෙහි ලැබීම් හා ගෙවීම් අතර රු.707,153,000 ක වෙනසක් ද පැවතුණි. | විගණනයට ඉදිරිපත් කරන ලද කම්කරු අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනට ශේෂ පිරික්සුමට වර්ෂය තුළදී භාණ්ඩාගාරයෙන් ලැබී තිබූ රු.709,243,000 ක් ඇතුළත් කර නොතිබුණු බව පිළි නොගන්නා අතර පළමුව මෙම ශේෂ පිරික්සුම පිළියෙල වීම කම්කරු අමාත්‍යාංශයේ පාලනයෙන් තොරව භාණ්ඩාගාරය මගින් CIGAS මෘදුකාංගය හරහා සිදුවන්නක් බවත් පෙන්වා දීමට කැමැත්තෙමි.<br>තවද, භාණ්ඩාගාරයෙන් ලද රු.709,243,000 ක මුුදල ඇතුළත් නොකර තුලනය වූ ශේෂ පිරික්සුමක් ඉදිරිපත් කිරීමට ද නොහැකි බව පෙන්වා දෙමි.<br>එමෙන්ම, රු.709,243,000 ත් රු.707,153,000 ත් අතර වෙනස වූ රු.2,090,000 ක අග්‍රිම වෙනස නිරවුල් කිරීම වෙනුවෙන් 2022-01-21 දින මාරු පත්‍රයක් ද යොමු කරමින් නිවැරදි කිරීමට කටයුතු කර ඇත. | චක්‍රලේඛයට අනුව මූල්‍ය වාර්තා සකස් කල යුතු වීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) වැය විෂයන් 17 කට අදාලව සලසා තිබූ රු.32,500,000 ක් වූ අයවැය ප්‍රතිපාදනයෙන් වැය විෂයන් 10 ක් සඳහා වූ රු.24,287,000 ක ප්‍රතිපාදන අමාත්‍ය මණ්ඩල ලේකම්වරයාගේ 2021 අගෝස්තු 31 දිනැති අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 21/1596/304/134 අනුව නැවත පවරා දී තිබුණි වැය විෂයන් 4 ක් | 2021 වර්ෂයේ වරින් වර ඇති වූ කොවඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් රට තුළ උද්ගත වූ තත්ත්වය මත අපේක්ෂිත ක්‍රියාකාරකම් ඉටුකිරීමට හැකියාවක් නොවූ බව පෙන්වා දෙමි. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව වියදම් ඇස්තමේන්තු හැකිතාක් තාර්කික පදනමින් හා නිවැරදිව පිළියෙල කලයුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | සඳහා ප්‍රතිපාදන පැවරීමෙන් පසු ඉතිරි වූ රු.1,013,000 ක් හා ඉතිරි වැය විෂයයන් 7 සඳහා මුළු ප්‍රතිපාදනය වූ රු.1,650,000 ක එකතුව රු.2,663,000 කින් 2021 වර්ෂය තුල කිසිදු වියදමක් දරා නොතිබුණි. එහි ඉතිරිය සියයට 100 ක් ව පැවතුණි. | | |
| (ආ) | වැය විෂයන් 27 කට අදාලව සලසා තිබූ රු.104,400,000 ක ප්‍රතිපාදනයෙන් රු.45,122,000 නැවත පවරාදී තිබූ අතර 2021 වර්ෂය අවසන් වන විට රු.32,813,486 ක් පමණක් උපයෝජනය කර තිබුණි. මෙම වැය විෂයන් අතරින් වැය විෂයන් 16 ක් සඳහා ඉතිරිවීමේ ප්‍රතිශතය සියයට 50 සිට සියයට 98 දක්වා පරාසයක පැවතුණි. | පිළිගනිමි. මේ සඳහා 2021 වර්ෂයේ වරින් වර ඇති වූ කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් රට තුළ උද්ගත වූ තත්ත්වය හා එවැනි අවස්ථාවන්හි දී ප්‍රාග්ධන වියදම්හි මූල්‍ය ප්‍රගතිය අත්කර ගැනීමට පූර්ව සැලසුම් සකස් කිරීමට නොහැකිවීම හේතුවෙන් අපේක්ෂිත ඉලක්ක කරා ළඟා වීමට නොහැකි විය. | -එම- |
| (ඇ) | 193-2-05-2001 වැය විෂයය යටතේ වෙන්කර තිබූ රු.4,000,000 ක ප්‍රතිපාදනය සියයට 100 ක් උපයෝජනය කල ලෙසට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණද වන්දි කොමාසාරිස් කාර්යාලයේ බෙදුම් ඇඳි සවි කිරීමේ කාර්යය වෙනුවෙන් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත මෙම ගෙවීම සිදුකර තිබුණි. 2022 ජූනි 17 වන විටද මෙම ව්‍යාපෘතිය ආරම්භ කර නොතිබුණි. | ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් 2021 මාර්තු 15 දිනට පෙර එය සකසා නිමකරන බව වන්දි කොමසාරිස් කාර්යාලය වෙත දන්වා තිබූ නමුත් 2022 අප්‍රේල් මස වන විටත් එය සිදු කිරීමට අපොහොසත් වූ අතර 2022 ජූනි 15 දිනට පෙර එය නිමකර දෙන බව දන්වා ඇත. | -එම- |
| (ඈ) | 2021 වර්ෂයේදී 193-2-5-2103 වැය විෂයය යටතේ යන්ත්‍ර හා යන්ත්‍රඋපකරණ අත්පත් කර ගැනීම හා 193-2-5-2102 ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ අත්පත් කර ගැනීම සඳහා වූ ඇස්තමේන්තුව සියයට 400 කට අධික ප්‍රමාණයකින් වැඩිවන පරිදි සංශෝධනය වී තිබූ අතර එයට හේතුව ලෙස නිලධාරීන්ට තම රාජකාරිය නිසි ආකාරව සිදුකිරීමට තිබෙන පරිගණක ප්‍රමාණවත් නොවන බව දක්වා තිබුණි. ඒ අනුව මෙය වර්ෂය ආරම්භයට පෙර හඳුනානොගත් | වර්ෂ කිහිපයක සිට අයවැය ඇස්තමේන්තු සකස් කිරීමේදී 193-2-5-0-2102 හා 193-2-5-0-2103 යටතේ ඉල්ලුම් කරන ලද ප්‍රතිපාදන වලට වඩා අඩු ප්‍රතිපාදනයක් වන්දි කොමසාරිස් කාර්යාලය වෙත ලබා දී ඇත 2021 වර්ෂයේ මැයි මාසයේ සිට රාජ්‍ය ආයතන වල ගිණුම්තැබීමේ ක්‍රියාවලිය සඳහා ITMIS වැඩසටන හඳුන්වාදීම හා රටේ පවත්නා COVID වසංගතය නිසා රාජකාරී කටයුතු ZOOM තාක්ෂණය | -එම- |

| | | |
|---|---|---|
| බැවින් මු.රෙ. 3 අනුව වියදම් සැලසුම් කිරීම නිසි පරිදි සිදුවී නොතිබුණි. | හරහා සිදුකිරීමට සිදුවීම නිසා නව පරිගණක වල අවශ්‍යතාවය දැඩිව පැන නැඟුනි. එබැවින් කාර්යාලයේ පවත්නා වියදම් කළමනාකරණය කර මු.රෙ.66 යටතේ ප්‍රතිපාදන මාරු කර නව පරිගණක මිලදී ගැනීමට කටයුතු කරන ලදී. | |

## 2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

-------------------------------

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල පෙන්වන රු.153,730 ක බැරකම් භාණ්ඩාගාර පොත්වල සටහන් නොවීම, 193-1-7-0-2401 වැය විෂය යටතේ පෞද්ගලික ආයතනයකට ගෙවිය යුතු රු.308,000 ක් වැඩිපුර මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් වීම හා එම වැය විෂයය යටතේම බදුල්ල දිස්ත්‍රික් කාර්යාලය විසින් භාණ්ඩාගාරයට වාර්තා කර තිබූ රු.4,518,165 ක් මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් නොවීම යන හේතූන් මත භාණ්ඩාගාර සටහන්වලට වඩා මූල්‍ය ප්‍රකාශනයෙහි රු.4,056,435 ක් අඩුවෙන් බැරකම් වාර්තා කර තිබුණි. | අදාළ ආයතනය වෙත රු.385,000.00 ක වටිනාකමක් ගෙවිය යුතු වුවත් ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම හේතුවෙන් රු.308,000.00 ක වටිනාකමක් ගෙවා රු.77,000.00 වටිනාකමක් ගෙවීමට ඉතිරිව ඇත. බැරකම් ලේඛනයෙහි සටහන් කළ යුත්තේ රු.77,000.00 වටිනාකමක් වුවත් වැරදීමකින් රු.385,000.00 ලෙස බැරකම් ලේඛනයෙහි සටහන් කර ඇත. | චක්‍රලේඛ උපදෙස්වලට අනුකූලව භාණ්ඩාගාරයේ හා මූල්‍ය ප්‍රකාශනවල බැරකම් වාර්තා කිරීම නිවැරදිව කලයුතු වීම. |

## 2.3 අත්තිකාරම් නිකුත් කිරීම හා පියවීම

-------------------------------------

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සේවය අතහැර ගොස් වසර 5 කට වැඩි කාලයක් ඉක්ම ගොස් තිබූ කළමණාකරණ සහකාරවරියකගෙන් අයවිය යුතු 138,501 ක මුදල, 2022 මැයි 04 | කළමණාකරණ සහකාරවරියගෙන් 2011 වර්ෂයේදී ආපදා ණය වශයෙන් රු.138,501 ක ණය මුදලක් ජාතික රක්ෂණ භාර අරමුදල ඇප | ආයතන සංග්‍රහයේ දක්වා ඇති පරිදි අප්‍රමාදව හිඟ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු |

| | | |
|---|---|---|
| දින වන විටත් අයකර ගත නොහැකිව පැවතුණි. | වශයෙන් තබා ලබාගෙන ඇති මෙම ණය මුදල නිරවුල් නොකිරීම සම්බන්ධයෙන් එම නිලධාරිණියට එරෙහිව නඩු පැවරීමට කටයුතු කර ඇත.<br>ආයතන සංග්‍රහයේ දක්වා ඇති විධිවිධාන නිසි ආකාරව පිළිපැද ඇති නමුත් ණය ශේෂයන් අය කර ගැනීමට මෙවන් ආයතනික ක්‍රියාමාර්ග හේතුවෙන් කටයුතු කළ නොහැක. කෙසේ වුවද, ජාතික රක්ෂණ භාර අරමුදල් සාමාජිකත්වය මත වූ රක්ෂණ ඔප්පුව ඇප වශයෙන් තබාගෙන ණය ලබාදීමේ ක්‍රියාවලිය වහාම ක්‍රියාත්මක වන පරිදි නවතා දැමීමට අප අමාත්‍යාංශය විසින් පියවර ගෙන ඇත.<br>තවද, මෙම ණය මුදල සම්බන්ධයෙන් ඉදිරි කටයුතු පිළිබඳව නීතිපති දෙපාර්තමේන්තුවෙන් විමසීම් කර ඇත. එමගින් ලැබෙන උපදෙස් අනුව කටයුතු කර ඔබ වෙත වාර්තා කරමි. | කලයුතු වීම. |

**2.4 තැන්පත් ශේෂයන්**

**---------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| (අ) 2021 වර්ෂයේදී විදේශාධාර ලෙස ලද රු.12,757,400 ක් එලදායිතා ලේකම් කාර්යාලයේ පොදු තැන්පත් ගිණුමට බැර කර තිබුණි. | 2021 වර්ෂය අවසාන කාර්තුවේ ඉතා හදිසි ප්‍රදානයක් වශයෙන් ආසියානු එලදායිතා සංවිධානය මගින් ජාතික එලදායිතා ලේකම් කාර්යාලය වෙත ඇමරිකානු ඩොලර් 90,000 ක ප්‍රදානයක් ලබාදීමට එකග විය.<br>මේ සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයේ කොවිඩ් මර්ධන ඒකකය සමග අදහස් ලබාගෙන ව්‍යාපෘති වාර්තාවක් සකස්කර ඒ සඳහා අනුමැතිය ලබාගන්නා ලදී. | විදේශාධාර ලබා ගැනීමේදී මුදල් රෙගුලාසි අනුව සහ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ 30/94 අනුව කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2021 දෙසැම්බර් 31 වන විට රු.10,014,543 ක වන්දි මුදල් 6000-0-0-17-0-26 දරන පොදු තැන්පත් ගිණුමෙහි රදවා තිබුණි. මේ තුල ඇතුලත් වන්දි ලැබී වසර 2 ඉක්මවූ වටිනාකම රු.536,326 ක් වූ අතර වන්දි මුදල් තැන්පත් කර වසර 1 ත් 2 ත් අතර අගය රු.1,371,986 ක් විය. තැන්පත් කර මාස 6 ත් වසරත් අතර අගය රු. 2,971,667 ක් විය. | 2021 දෙසැම්බර් 31 වන විට 6000-0-0-17-0-26 දරන පොදු තැන්පත් ගිණුමෙහි පැවති ශේෂයන් අද වන විට පවතින ශේෂය රු.3,173,006.13 ක් වේ. | අගතියට පත් පාර්ශවයන් වෙත වන්දි මුදල් කඩිනමින් ලබා දිය යුතුය. |
| (ඇ) | විවිධ හේතූන් මත හිමිකරුවන් වෙත ලබානොදුන් වන්දි මුදල්වලින් රු.2,023,096 ක් සඳහා වන්දි කොමසාරිස් නමින් ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ ගිණුම් ආරම්භකර තිබුණි. මෙම මුදල් ගිණුම්වල තැන්පත් කර මාස 22 සිට මාස 48 දක්වා කාලයක් ගතවී තිබුණද උසාවි කටයුතු අවසන් නොවීම හේතුවෙන් හිමිකරුවන් වෙත නිදහස් කිරීමට නොහැකි වී තිබුණි. | වන්දි කොමසාරිස් නමින් ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ තැන්පත් කර ඇති සියලුම ගිණුම් අභියාචනා ලිපි ගොනු වන අතර ඒවායේ උසාවි කටයුතු තවමත් සිදුවෙමින් පවතී. උසාවි කටයුතු අවසන් වී එම ගිණුම් නිදහස් කරන අවස්ථාවේදී වැඩි පොලී මුදලක් අයකර දීම අරමුණුකොට ගෙන ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ කම්කරු වන්දි කොමසාරිස් නමින් තැන්පත් කර ඇත. | -එම- |

## 2.5 බැංකු ගිණුම් මෙහෙයවීම

---------------------------

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අමාත්‍යාංශයේ ගිණුම් අංක 10015902566 ට අදාලව 2021 දෙසැම්බර් 30 හා 31 දිනවලදී ආයතන 5 ක් සඳහා ලියා තිබූ රු.9,724,913 ක් වටිනා චෙක්පත් 7 ක් අතරින් 5 ක් අදාල පුද්ගලයන් වෙත නිකුත් කිරීම 2022 මැයි මසද චෙක්පත් 2 ක් 2022 මාර්තු මස ද සිදුවී තිබීම හේතුවෙන් මෙම චෙක්පත් ලිවීම, වැඩ නිම නොවූ කාර්යයන් වෙනුවෙන් ප්‍රතිපාදන රදවා තබාගැනීමේ අරමුණින් සිදුකර තිබිමත් බව නිරීක්ෂණය විය. | චෙක්පත් හි දින දීර්ඝ කර අදාල පුද්ගලයින් හා ආයතන වෙත ලබා දීමට කටයුතු කර ඇත. | ප්‍රතිපාදන රදවා ගැනීමේ අරමුණින් චෙක්පත් ලිවීම නොකල යුතු අතර ගෙවීම් කිරීමේදී මුදල් රෙගුලාසි අනුව කටයුතු කල යුතුය. |

## 2.6 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

---------------------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නිරීක්ෂණය | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | | |
| (අ) | විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අංක SC & PMU/Grant/20 හා 2020 අගෝස්තු 14 දිනැති ලිපියේ හා මු.රෙ. 610 සිට 626 දක්වා සඳහන් විධිවිධාන | මෙම ලිපියෙහි උපදෙස් අනුගමනය කිරීමකින් තොරව හා ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල් ඇමතීමක් නොමැතිව ජාතික එලදායීතා ලේකම් කාර්යාලය විසින් 2021 වර්ෂයේදී ආසියානු එලදායීතා සංවිධානයෙන් රු.18,427,300 ක්වූ විදේශාධාර සෘජුවම ලබාගෙන තිබුණි. එයින් 2021 වර්ෂයේදී රු.12,757,400 ක් හා 2022 වර්ෂයේදී රු.5,669,900 පොදු තැන්පත් ගිණුමට බැර කර තිබුණු අතර උපයෝජනය කිරීමට පෙර පරිපූරක හා වීරමොං ක්‍රියා පටිපාටිය මගින් ඇස්තමේන්තු ප්‍රතිපාදන සලසා ගෙන නොතිබුණි. | 2021 වර්ෂය අවසාන කාර්තුවේ ඉතා හදිසි ප්‍රදානයක් වශයෙන් ආසියානු ඵලදායිතා සංවිධානය මගින් ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය වෙත ඇමරිකානු ඩොලර් 90,000 ක ප්‍රදානයක් ලබාදීමට එකග විය. මේ සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයේ කොවිඩ් මර්ධන ඒකකය සමග අදහස් ලබාගෙන ඉතා කඩිනමින් ව්‍යාපෘති වාර්තාවක් සකස්කර ඒ සඳහා අනුමැතිය ලබාගන්නා ලදී. | විදේශාධාර සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ හා උපදෙස් අනුව කටයුතු කල යුතු වීම. |

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

**--------------------------**

**3.1** **දැක්ම හා මෙහෙවර**

**----------------------**

අමාත්‍යාංශය ප්‍රධාන කාර්යයක් ලෙස දක්වා තිබූ කම්කරු අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල විෂයන්ට අදාල ප්‍රතිපත්ති, වැඩසටහන් සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම පසුවිපරම් කිරීම හා ඇගයීම යන කාර්යය හා සේවක අර්ථසාධක අරමුදල, පරිපාලනය කිරීම යන කාර්යය විධිමත් පරිදි ඉටුවී නොමැති බව පහත කරුණු අනුව හෙළිදරව් වේ.

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| (අ) සේවක අර්ථසාධක අරමුදලෙහි 2021 දෙසැම්බර් 31 දින වන විට කේවල ගිණුම්වලට බැර නොවූ රු.9,933,449,162 ක් ශ්‍රී ලංකා මහ බැංකුවේ කම්කරු කොමසාරිස් දායක ගිණුමේ රු.301,779,837 ක් දෙපාර්තමේන්තුවේ සේවක අර්ථසාධක අරමුදල් තැන්පත් ගිණුමේ හා දෙපාර්තමේන්තු උප කාර්යාලවලද තැන්පත් ගිණුම්වල රැඳී තිබීම, විශේෂ විමර්ශන අංශයට ලැබුණු පෙත්සම්වලින් 2021 සැප්තැම්බර් වන විට 2015 සිට 2020 දක්වා වර්ෂයන්ට අදාලව පැමිණිලි 308 ක් බවත් ඉන් සියයට 57 ක් එනම්, 178 ක් විසඳා නොතිබීම, 2021 දෙසැම්බර් 31 වන විට අක්‍රියව පැවති නඩු සංඛ්‍යාව 5,151 ක් වන අතර එහි අයකර ගතයුතු වටිනාකම රු.3,108,693,249 ක් විම යන කරුණු අනුව කම්කරු අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යයක් ඉටුවී නොතිබුණි. | “සී” වාර්තා වල සඳහන් දුර්වලතා මත මෙම මුදල් දීර්ඝ කාලයක සිට රඳවාගෙන පවතින අතර නිරවුල් කිරීමේදී භෞතික ලේඛන විශාල වශයෙන් පරිශීලනය කිරීමට සිදුවේ. ශ්‍රී ලංකා මහ බැංකුවේ පරිගණක දත්ත පද්ධතිය සමඟ සේවක අර්ථ සාධක අරමුදලේ සාමාජික තොරතුරු වල පවතින නොගැලපීම් නිරවුල් කිරීමේ කටයුතු කරමින් පවතින අතර මේ සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ සහයෝගය අත්‍යාවශ්‍යව පවතී.<br>පොදු තැන්පත් ගිණුමේ රැඳී තිබෙන මුදල් නිදහස් කිරීමේ ප්‍රගතිය ද එහි කාල විශ්ලේෂණය ද නිරන්තරයෙන් අධීක්ෂණයට ලක් කරනු ලබයි. විවිධ ක්‍රමවේදයන් සකස් කර පැරණි ණය ශේෂ නිරවුල් කිරීමට කටයුතු කරනු ලැබේ. කම්කරු දෙපාර්තමේන්තුව වෙත නඩු, පැමිණිලි පෙත්සම් විශාල සංඛ්‍යාවක් දෛනිකව එක් වෙමින් පවතින ආයතනයකි. පෙත්සම් සඳහා විසඳුම් ලබා දීම සිදු කරනු ලැබේ.විවෘත වරෙන්තු නිකුත් කර තිබීම, වගඋත්තර කරුවන්ගේ ලිපිනයන් පරීක්ෂාව කාර්යාල මට්ටමින් | අමාත්‍යාංශයේ දැක්ම හා මෙහෙවර ඉටුකර ගැනීමට අදාල ප්‍රධාන කාර්යයන් වන කම්කරු අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයන්ට අදාල ප්‍රතිපත්ති, වැඩසටහන් සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම නිසි පරිදි ඉටුකල යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | | සක්‍රීය කිරීමට පියවර ගැනීම යනාදී කරුණු මගින් අක්‍රීයව පවතින නඩු සක්‍රීය කිරීමට පියවර ගෙන ඇත. | |
| (ආ) | 1934 අංක 19 දරණ කම්කරු වන්දි ආඥා පනත යටතේ පිහිටුවා ඇති වන්දි කොමසාරිස් කාර්යාලයේ දැක්ම ලෙසට, "ආපදාවකට හෝ මරණයකට පත්වන සේවකයන් වෙනුවෙන් සේවායෝජකයන්ගෙන් අප්‍රමාදව වන්දි අයකරදීම මගින් සේවක තෘප්තිය ඇති කිරීම" දක්වා තිබුණද, සේවයේ යෙදී සිටියදී සිදුවන මාරක හා මාරක නොවන අනතුරු සම්බන්ධව වන්දි අයකරදීමේ ක්‍රියාවලියේදී අධික ප්‍රමාදයන් සිදුවන බව විගණනයේදී අනාවරණය වීම. | මාරක හෝ මාරක නොවන අනතුරක් පිළිබඳව කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලයට ඉල්ලීමක් ලැබුණු විට ඒ සඳහා නඩු ගොණුවක් විවෘත කිරීමට අඥා පනත ප්‍රකාරව විධිමත් අයදුම්පත්‍රයක් හා වෛද්‍ය වාර්තාවක් ඉදිරිපත් කල යුතු වේ. ඒ අනුව අයදුම්පතෙහි හා වෛද්‍ය වාර්තාවේ අඩුපාඩු තිබෙන අවස්ථාවන්හිදී ඒවා නිවැරදි කර ගන්නා තෙක් මූලික කටයුතු ආරම්භ කිරීම ද ප්‍රමාද විය හැක.<br>නඩු ගොණුව විවෘත කර සේවා යෝජකගෙන් වාර්තාවක් කැඳවිය යුතුවේ. පනත ප්‍රකාරව එම වාර්තාව ඉදිරිපත් කිරීමට දින 30 ක කාලයක් ලබා දිය යුතු වේ. එම කාලයෙන් පසුව වාර්තාව ඉදිරිපත් නොකරන්නේ නම් හෝ අනතුර ප්‍රතික්ෂේප කරන්නේ නම් කම්කරු වන්දි අධිකරණයට යොමු කරනු ලබයි.<br>මෙහි ඉල්ලුම්කරුවන් ආබාධිතව පසුවන බැවින් එක්වරක් හෝ පැමිණීමට නොහැකිවීම මත නඩුව නිෂ්ප්‍රභා නොකරන අතර ඔහුට යුක්තිය ඉෂ්ට වීම පිණිස වාර කීපයක් දින ලබා දෙයි.<br>සේවා යෝජක පළමු දිනයේම බොහෝ දුරට අධිකරණය පැමිණෙන්නේ නැති බැවින් ඔවුන් අධිකරණයට ගෙන්වා ගැනීමට ලියාපදිංචි තැපැල්, පොලීසිය මඟින් ග්‍රාමසේවක | ප්‍රධාන කාර්යයන් ඉටුවන පරිදි කටයුතු කිරීම හා එම කාර්යයන් ඉටු කිරීම පිළිබඳව පසු විපරම් කිරීම අමාත්‍යාංශයේ වගකීමක් විය යුතුය. |

| | | |
|---|---|---|
| | මඟින් නොතීසි භාරදීමට කටයුතු කල යුතුය. එමඟින්ද ප්‍රමාද සිදු විය හැක. | |

**3.2 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්**

**--------------------------------**

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලයේ වන්දි උසාවිය සඳහා බෙදුම් ඇදි සවි කිරීමේ කොන්ත්‍රාත්තුව අමාත්‍යාංශයේ වැය ශීර්ෂයේ වැඩ සටහන් 2 ක් යටතේ සලසා තිබූ ප්‍රතිපාදන උපයෝජනය කරගෙන රු.6,090,000 ක් 2021 දෙසැම්බර් 29 දින ගොඩනැගිලි අධ්‍යක්ෂ ජනරාල් වෙත ගෙවීම් කර තිබුණි. මේ සඳහා ලිඛිත ගිවිසුමක් නොතිබුණු අතර 2022 මාර්තු 15 දිනට කාර්ය නිමකරන බවට දැනුම් දී තිබුණ ද 2022 මැයි 25 දින වන විටද මෙම කාර්යය ආරම්භකර නොතිබුණු බැවින් ව්‍යාපෘතිය ඉටු කිරීමේ අධික ප්‍රමාදයක් සිදු වී තිබුණි. | ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් 2021 මාර්තු 15 දිනට පෙර එය සකසා නිමකරන බව අප වෙත දන්වා තිබුණද 2022 අප්‍රේල් මස වන විටත් එය සිදු කිරීමට අපොහොසත් වූ අතර 2022 ජූනි 15 දිනට පෙර එය නිමකර දෙන බවත් අප වෙත දන්වා එවා ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කල යුතුය. |

**3.3 වාර්ෂික කාර්යසාධන වාර්තාව**

**--------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කල මාර්ගෝපදේශ අංක 14 හි 01 පරිච්ඡේදයේ 1.5 අනුව විදේශාධාර ලබන ව්‍යාපෘති තිබේ නම් ඒවායේ තොරතුරු වාර්ෂික කාර්යසාධන වාර්තාව ඇතුලත් කල යුතු වුවද අමාත්‍යාංශය යටතේ ඇති ජාතික ඵලදායීතා ලේකම් | අතපසුවීමකින් 1.3 ඡේදය යටතේ ප්‍රධාන කාර්යයන් සහ සංවිධාන සටහන ඇතුලත් කර නොමැති බව දන්වන අතර 2022 ජූනි 30 දිනට පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා පිළියෙළ කරන වාර්තාව සඳහා එම කරුණු ඇතුලත් කර ඇති බව වැඩිදුරටත් දන්වමි. | චක්‍රලේඛය ප්‍රකාරව අදාළ තොරතුරු වාර්ෂික කාර්යසාධන වාර්තාවට ඇතුළත් කළ යුතු වීම. |

කාර්යාලයට ආසියානු ඵලදායීතා සංගමය මගින් ලබාදී තිබූ ඇ.ඩොලර් 90,000 ක මුදලින් මහියංගන රෝහලට අවශ්‍ය වෛද්‍ය උපකරණ ලබාදීමේ ව්‍යාපෘතිය පිළිබඳ තොරතුරු ඇතුලත් කර නොතිබුණි.

**3.4 ප්‍රසම්පාදනයන්**

--------------------

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අම්පාර නිවාඩු නිකේතනය පිහිටි ඉඩමෙහි රියදුරන් සඳහා නවාතැන් ගන්නා ස්ථානයක් (Driver's Lodge) ඉදිකිරීම වෙනුවෙන් වූ කොන්ත්‍රාත්තුව 2021 අගෝස්තු මස රු.5,095,983 ක වටිනාකමකට පුද්ගලික ආයතනයකට පවරා තිබුණි. කොන්ත්‍රාත් ගිවිසුමට අනුව ගෙවිය යුතු අත්තිකාරම් වටිනාකම 20% ක් වුවද ගිවිසුම් කොන්දේසි කඩකරමින් 2021 දෙසැම්බර් 29 දින රු.1,149,855 ක්ද 2021 දෙසැම්බර් 31 දින රු.3,617,753 ක් වශයෙන් (රඳවා ගැනීම් මුදල් අඩුකල පසු) කොන්ත්‍රාත්තුවේ මුළු වටිනාකමට අත්තිකාරම් ලෙස ගෙවීමට කටයුතු කර තිබුණි. කොන්ත්‍රාත් ගිවිසුමට අනුව 2022 ජනවාරි මස අවසන් කල යුතුව තිබූ මෙම කොන්ත්‍රාත්තුව 2022 මැයි 25 වන විටද නිම වී නොතිබුණු අතර ගිවිසුම් ප්‍රකාරව ප්‍රමාද ගාස්තු අයකර ගැනීමටද කටයුතු කර නොතිබුණි. | අම්පාර නිවාඩු නිකේතනයේ පිහිටි ඉඩමේ රියදුරන් සඳහා නවාතැන් ගන්නා ස්ථානයේ ඉදිකිරීම්වල සියයට 65ක ප්‍රමාණයක් 2021 දෙසැම්බර් 31 වන විට අවසන් කර ඇති අතර වර්ෂ 2022 ජනවාරි මස වන විට සම්පූර්ණ ඉදි කිරීම් අවසන් කිරීමට කොන්ත්‍රාත් හිමියන් හා එකඟව තිබුණි. නමුත් වර්තමානයේ පවතින ආර්ථික අර්බුදය හමුවේ ඉදිකිරීම් කටයුතු අවසන් කිරීමේ කාලය 2022 වර්ෂයේ මැයි මස දක්වා දීර්ඝ කරන ලෙස කොන්ත්‍රාත්හිමියන් ඉල්ලා සිටි අතර අමාත්‍යාංශය මඟින් මෙම දීර්ඝ කිරීමට අනුමැතිය ලබා දෙන ලදී. ඒ අනුව අදාල කොන්ත්‍රාත්හිමියන් විසින් 2022 මැයි 31 වන විට අම්පාර නිවාඩු නිකේතනයේ මෙම ඉදිකිරීම් වල කටයුතු අවසන් කොට අප අමාත්‍යාංශය වෙත බාර ගන්නා ලෙස වාචිකව ඉල්ලා සිටි අතර කම්කරු දෙපාර්තමේන්තුවේ සිවිල් ඉංජිනේරු විසින් ඉදිකිරීම් වල ගුණාත්මක බව ක්ෂේත්‍ර පරීක්ෂාවක් සිදු කොට වාර්තාවක් ඉදිරිපත් කල යුතුව තිබුණි. | වැඩ සඳහා අත්තිකාරම් ගෙවීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුව හා ගිවිසුම් කොන්දේසි ප්‍රකාරව කටයුතු කලයුතුයි. |

**3.5** **පාඩු හා හානි**

**---------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| (අ) හානිවීම් සිදුවී වසර 6 සිට 8 දක්වා කාලයක් ඉක්ම ගියද 2013 – 2015 කාලය තුල වාහන 5 කට වූ රු.403,939 ක හානි සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි අනුව කටයුතු කර අයකර ගැනීමට හෝ පොතෙන් කපාහැරීමට කටයුතු නොකර දිගින් දිගටම මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කර තිබුණි. | විගණන විමසුමේ සඳහන් කර තිබෙන රථ අනතුරු සිදුවී වසර ගණනාවක කාලයක් ඉක්මවා තිබේ. එම කාලයන්හිදී මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර ඇති නමුත් ලිපිගොණු වල අදාල සටහන් තබා නොමැති බව සඳහන් කරමි. එම නිසා එම ලිපිගොනු නැවත පරීක්ෂාවට භාජනය කර එම ලිපි ගොනුවලට අදාල අඩුපාඩු හෝ සම්පූර්ණ නිම කර නොමැති ගොනු කඩිනමින් නිවැරදි කර අදාල ලේඛණ වලට ඇතුලත් කිරීමට කටයුතු කරන බව දන්වමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ආ) ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලයේ කාර්යමණ්ඩල වැටුප් සැකසීමේදී වැටුප් අංශයේ කළමණාකරණ සහකාර නිලධාරිනියක විසින් වැටුප් වංචාවක් සිදුකර තිබූ අතර ඒ සම්බන්ධයෙන් 2022 ජනවාරි 11 දින හෙළිදරවු කරගෙන තිබුණි. මෙම වැටුප් වංචාව 2018 අගෝස්තු මාසයේදී පමණ සිට 2020 දෙසැම්බර් දක්වා සිදුකර තිබූ අතර දළ වශයෙන් එහි වටිනාකම රු.5,133,520 ක් වී තිබුණි. ඒ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමක් සිදුකර නොතිබුණු අතර මාස 5 ½ ගතවී තිබුණ ද මූලික විමර්ශන අවසන් කර නොතිබුණි. | ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලයේ කාර්ය මණ්ඩලය සඳහා වැටුප් ගෙවීමේදී සිදුවූ මුදල් වංචාව පිළිබඳව අනාවරණය වූයේ 2022 වර්ෂයේ ජනවාරි මාසයේදී බැවින් 2021 වර්ෂයේ හානි හා පාඩු යටතේ ගිණුම්ගත නොකරන ලදී.<br>ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලයේ සමස්ත ක්‍රියාවලිය විමර්ෂණය කිරීමට පත් කළ කමිටුව මගින් මුළු අලාභය රු.5,133,520 ට ආසන්න මුදලක් ලෙස හඳුනාගෙන තිබෙන අතර වාර්තාවක් සකස් කරමින් පවතී.<br>කෙසේ වුවද**,** මේ සම්බන්ධයෙන් අදාල නිලධාරිණිය වැඩ තහනමට ලක් කර විදේශ ගමන් නතර කොට ඇත. අධිකරණයේ නඩුවක් ගොණු කර වංචා කළ මුදලින් කොටසක් අයකරගෙන ඇත. | ආයතන සංග්‍රහයේ විෂය II කොටස අනුව කටයුතු කල යුතුය. |

## 3.6 අනාර්ථික ගණුදෙනු

----------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අමාත්‍යාංශ කාර්යමණ්ඩලයට ආහාර අනුභවය සඳහා මෙහෙවර පියෙස ගොඩනැගිල්ලෙහි 6 වන මහලෙහි ස්ථානයක් සකක් කිරීම වෙනුවෙන් රාජ්‍ය දැව සංස්ථාවට රු.1,159,662 ක් 2021 දෙසැම්බර් 06 දින ගෙවීම් කර තිබුණි. මෙහෙවර පියෙස 4 වන මහලෙහි වර්ග අඩි 11,286 ක ආපන ශාලාවක් ස්ථාපිත කර තිබිය දී අමාත්‍යාංශයේ නිලධාරීන් වෙනුවෙන් පමණක් ආහාර ගැනීමේ ස්ථානයක් සඳහා රු.1,159,662 ක් වැය කර තිබුණි. | මෙහෙවර පියෙස ගොඩනැගිල්ලේ 06 සහ 07 මහල් හි පවත්වාගෙන යනු ලබන කම්කරු අමාත්‍යාංශය මඟින් විවිධ ක්ෂේත්‍රයන් ආවරණය කරමින් අමාත්‍යාංශය සහ අනුබද්ධිත ආයතන පොදු මහජනතාව උදෙසා සේවාවන් සැපයීම හා අවශ්‍ය උපදෙස් හා මඟපෙන්වීම ලබාදීම මෙන් ම අනෙකුත් රාජ්‍ය අංශයේ හා පෞද්ගලික අංශයේ ආයතන සම්බන්ධීකරණ කරමින් විශාල කාර්යය භාරයක් ඉටුකරනු ලැබේ.<br>මෙලෙස උක්ත රාජකාරි ඉටුකිරීම සඳහා දෛනිකව අමාත්‍යාංශය පරිශ්‍රය තුළ විවිධ රැස්වීම් සහ සාකච්ඡා මෙන්ම විවිධ ජාතික හා ජාත්‍යන්තර ආයතන නියෝජනය කරමින් අමාත්‍යාංශය වෙත පැමිණෙන නිලධාරීන්ට හා ආරාධිත අමුත්තන්ට අප රටෙ හි අභිමානය ආරක්ෂා වන පරිදි සංග්‍රහ කිරීම අනිවාර්යෙන් ම කළ යුතු කාර්යයක් වේ. අදාල සංග්‍රහ කටයුතු සිදුකිරීම සඳහා තේ පැන් පිළියෙල කිරීමට හා සෙසු කටයුතු සූදානම් කිරීම සඳහා අමාත්‍යාංශය සතුව නිශ්චිත ස්ථානයක් නොපැවතීම මත විවිධ අපහසුතාවන්ට මුහුණ දීමට සිදුවීම හේතුවෙන් ආරාධිත අමුත්තන්ට සංග්‍රහ කිරීමට ඇවැසි කාර්යයන් ඉටුකර ගැනීම සඳහා පහසුකම් වලින් යුතු ස්ථානයක් සැකසීමට යෝජනා විය. ඒ අනුව අදාල යෝජිත කොටසෙ හි එම ස්ථානය නිසි පරිදි සකස් කිරීම සඳහා කම්කරු කොමසාරිස් ජනරාල්තුමාගේ එකඟතාවය ද | රජයේ වියදම් සීමා කිරීම සඳහා උපදෙස් දී තිබියදී මූලධන වැයකිරීම්, පිරිමැසුම් බව පිළිබඳ සැලකිලිමත් වීම හා ඵලදායී කාර්යයන් සඳහා මුදල යෙදවීම සිදුකල යුතු වීම. |

ලබාගෙන අනතුරුව මෙකී ස්ථානය ස්ථාපිත කරන ලදී.

## 3.7 කළමනාකරණ දුර්වලතා

----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ලීසිං වාරික ගෙවා අවසන්ව තිබූ ජාතික එලදායිතා ලේකම් කාර්යාලය විසින් භාවිත කරනු ලබන වාහන 5 ක් අයිතිය පවරා ගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් එම වාහනවල පරම අයිතිය ලංකා බැංකුව සතුව තිබූ අතර තවත් වාහන 4 ක වර්තමාන අයිතිය ජාතික එලදායීතා ලේකම් කාර්යාලය නමින් නොතිබුණි. | මේ පිළිබඳ ලංකා බැංකුවෙන් විමසූ අතර, එහි ලීසිං වාරික ගෙවා අවසන්ව ඇති බවත් අදාළ රථ පවරා ගත හැකි බවත් දැන්වීය. ජාතික එලදායිතා ලේකම් කාර්යාලය භාවිතා කරනු ලබන වාහන මෙම කාර්යාලය නමින් පවරා ගැනීම සඳහා මීට පෙර මෙම කාර්යාලය අයත්ව පැවැති රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය වෙතින් ඉල්ලීම් කරන ලද අතර, එම අමාත්‍යාංශය මඟින් අප වෙත දන්වා සිටියේ ජාතික එලදායිතා ලේකම් කාර්යාලය රාජ්‍ය පරිපාලන හා කලමනාකරණ අමාත්‍යාංශය යටතේ පවතින ආයතනයක් වන බැවින් පවරා දීමට හැකියාවක් නොමැති බවයි. එබැවින්, මෙම කාර්යාලය නමින් වාහන පවරා ගැනීමක් සිදු වී නොමැත. | වාහන ආයතනයේ නමට ලියාපදිංචි කිරීම කඩිනමින් කල යුතුය. |
| (ආ) 1934 අංක 19 දරණ කම්කරු වන්දි ආඥා පනතෙහි XII කොටසේ 57 (1) වගන්තිය අනුව සේවකයෙකුට සේවයේ යෙදී සිටියදී අනතුරක් සිදු වී දින 14 ක් තුල සේවායෝජකයා විසින් කම්කරු කොමසාරිස් වෙත වාර්තාවක් ඉදිරිපත් කලයුතු වුවද මේ සඳහා කිසියම් ක්‍රමවේදයක් සකස්කර නොතිබීම නිසා කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය වෙත වාර්තා වී තිබූ අනතුරු මාස 5 සිට අවුරුදු 12 දක්වා ප්‍රමාද වී ලැබී තිබූ බව ලේඛණ අනුව අනාවරණය විය. | අනතුර සිදුවී දින 14 තුල සේවායෝජකයා විසින් කම්කරු වන්දි කොමසාරිස් වෙත වාර්තාකල යුතු වුවද ඒ සඳහා ක්‍රියාමාර්ග ගැනීමට නම් මහේස්ත්‍රාත් අධිකරණයක නඩුවක් පැවරිය යුතු බැවින් එය ප්‍රයෝගිකව අපහසු ක්‍රියාවලියකි. එම ක්‍රියාවලිය කරගෙන යාම සඳහා සුදුසු යාන්ත්‍රනයක් මෙම ආයතනයේ මේ වනතෙක් නිබී නැත. | අදාල පනත සංශෝධනය සඳහා කඩිනම් ක්‍රියාමාර්ග ගෙන විධිමත් ක්‍රමවේදයක් සකස් කිරීමට වගකිව යුතු නිලධාරීන් කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | කම්කරු අමාත්‍යාංශයේ භෞතිකව නොතිබුණු නමුත් කම්කරු අමාත්‍යාංශය නමින් ලියාපදිංචි කර ඇති වාහන 8 කින් එක් වාහනයක් හදිසි අනතුරකින් පසුව ගර්හිත තත්ත්වයට පත්කර 2018 වර්ෂයේදී රක්ෂණභාර අරමුදල වෙත පවරාදී තිබූ බව දරනුම් දී තිබුණි. එහෙත් එම වාහනය සඳහා 2021 වර්ෂයේදී නව ආදායම් බලපත්‍රයක් ලබාගෙන භාවිතා කරන බවත් අනෙක් වාහන 7 සම්බන්ධයෙන්ද තොරතුරු ලබාගෙන අදාල ආයතන වෙත පැවරීම 2021 වර්ෂය අවසන් වන විටද සිදු වී නොතිබුණි. | මේ වන විට මෙම අමාත්‍යාංශය විසින් භාවිතයට නොගන්නා මෙම වාහන 08 පිළිබඳ මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් වෙතින් තොරතුරු ලබා ගන්නා ලදී. එම තොරතුරුවලට අනුව එක් වාහනයක් ලේකම්, කම්කරු හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය නමින් ලියාපදිංචි කර ඇති බව සඳහන්ව ඇත.<br>ඉතිරි වාහන 07 සම්බන්ධයෙන් වැඩිදුර තොරතුරු විමසා ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය, නිපුණතා සංවර්ධන,වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ සහ නවෝත්පාදන රාජ්‍ය අමාත්‍යාංශයේ හෝ වෙනත් අනුබද්ධ ආයතනයක් සතුව තිබේ නම් එම තොරතුරු මෙම අමාත්‍යාංශය වෙත දන්වා එවන ලෙස ලිපියක් මඟින් ඉල්ලීමක් කර ඇත. ඒ අනුව, නිපුණතා සංවර්ධන,වෘත්තීය අධ්‍යාපන,පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශයට අනුබද්ධ ආයතනයක් වන තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව සතුව එක් රථයක් පවතින බව දන්වා ඇති අතර එම වාහනය විධිමත් පරිදි රථය පවරා දීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. අනෙක් වාහන 06 සම්බන්ධයෙන් තොරතුරු ලබා ගත් පසුව වාහන තිබෙන ස්ථාන හඳුනාගෙන අදාල ආයතන වලට පවරා දීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව දන්වා සිටිමි. | මෙම වාහන පිළිබඳව කඩිනමින් තොරතුරු ලබාගෙන අවශ්‍ය විධිමත් ක්‍රියාමාර්ග ගත යුතුව ඇත. |
| (ඇ) | යහපත් රැකියා වාතාවරණයක් සඳහා වූ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම(සුනිසි මෙහෙවර) සඳහා වාර්ෂික ඇස්තමේන්තු මගින් සලසා තිබූ රු.45,000,000 ක ප්‍රතිපාදනය උපයෝජනය කරමින් වෙනත් මූලධන වැය විෂයයන් 03 ක් සඳහා රු.11,856,138 ක්ද 2021 වර්ෂයේ ප්‍රතිපාදන සලසා ගෙන | සුනිසි මෙහෙවර වැඩසටහන පූර්ණ, ඵලදායි සහ යහපත් රැකියා ප්‍රවර්ධනය සඳහා කටයුතු කරනු ලැබේ. සුනිසි රැකියා උත්පාදනය, ප්‍රවර්ධනය හා ජාතික ඵලදායිතාව, වැඩබිමෙහි හිමිකම, සමාජ ආරක්ෂණය, සමාජ කතිකාවත ප්‍රවර්ධනය සඳහා කම්කරු අමාත්‍යාංශයටත් අනුබද්ධ ආයතනවලටත් සුදුසු වාතාවරණයක් | සුනිසි මෙහෙවර ප්‍රතිපාදන එම අරමුණ ඉටු කර ගැනීම සඳහා පමණක් වැය කලයුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | නොතිබුණු කාර්යයක් වෙනුවෙන් රු.3,028,506 ක් ද වශයෙන් රු.14,884,644 ක් වැය කර තිබුණි. | තිබීම අත්‍යවශ්‍ය වේ. එබැවින් කම්කරු අමාත්‍යාංශය හා අනුබද්ධ ආයතනවල ඵලදායිතාවය ඉහළ නැංවීම සඳහා සහ යහපත් රැකියා ප්‍රවර්ධනය සඳහා සුදුසු වාතාවරණයක් ඇති කිරීම සඳහා මෙම ප්‍රතිපාදන යොදවා ගන්නා ලදී. | |
| (ඉ) | ඵලදායිතා සංවර්ධන නිලධාරීන් 138 ක් සේවයේ යෙදී සිටින ප්‍රදේශීය ලේකම් කාර්යාල හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල 75 ක් 2020 වර්ෂයේ ඵලදායිතා සම්මාන තරඟාවලියට ඉදිරිපත් වී නොතිබුණි. | ජාතික ඵලදායිතා සම්මාන තරගාවලිය 2020 වර්ෂයට අදාළව අයදුම්පත් කැඳවීම සිදු කර දිවයින පුරා නිර්ණායක පැහැදිලි කිරීමේ වැඩසටහන් පළාත් වශයෙන් හා දිස්ත්‍රික් වශයෙන් පාසල්, පිරිවෙන්,රාජ්‍ය ආයතන සහ නිෂ්පාදන හා සේවා ආයතන ආවරණය වන පරිදි පවත්වන ලදී.ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය, දිස්ත්‍රික් ලේකම් කාර්යාල වල සිටින ඵලදායිතා සංවර්ධන නිලධාරීන් මඟින් සියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල ඵලදායිතා සංවර්ධන නිලධාරීන් මෙම වැඩමුළු පවත්වන දිනයන් හා ආයතන යොමු කළ යුතු වේලාවන් අධ්‍යක්ෂවරයා විසින් ලිඛිතව දැනුවත් කරන ලදී. එසේම අපගේ නිල වෙබ් අඩවියේද මේ පිළිබඳව භාෂා තුනෙන්ම දැනුවත් කිරීම සිදු කරන ලදී.<br>තවදුරටත් විවිධ දැනුවත් කිරීම් වැඩසටහන් පැවැත්වුවද කොවිඩ් වසංගතය පැතිරීම හේතුවෙන් අයදුම්පත් ඉදිරිපත් කිරීම අඩු මට්ටමක පැවතුණි. | ඵලදායිතා සංවර්ධන නිලධාරීන් සේවයේ යෙදී සිටින ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ඵලදායිතා සංකල්ප විධිමත් පරිදි ක්‍රියාත්මක කල යුතුය. |
| (ඊ) | 1980 ජූලි වර්ජකයන්ට දීමනා ගෙවීම සඳහා ජාතික අයවැය දෙපාර්තමේන්තුවෙන් අයදුම්පත් නිර්දේශ කිරීමේදී කම්කරු අමාත්‍යාංශය විසින් එකම ප්‍රතිලාභීන්ගේ අයදුම්පත් දෙකක් නිර්දේශ කිරීම හේතුවෙන් රු.1,000,000 ක වැඩිපුර ගෙවීමක් සිදුව තිබූ බව පසුගිය විගණන වාර්තාවෙන් පෙන්වාදී තිබුණි. පසුව අදාල දත්ත පද්ධතිය නිවැරදි | 2022 වර්ෂයට අදාලව ගෙවීම් සඳහා නිර්දේශ කරන ලද ඉතාමත් සීමිත අයදුම් පත්‍ර ප්‍රමාණයක තොරතුරු දත්ත පද්ධතියෙහි යාවත්කාලීන කිරීම අතපසු වී ඇත. එම තොරතුරු සියල්ල වහාම දත්ත පද්ධතියට ඇතුළත් කිරීමට අවශ්‍ය කටයුතු ඉටුකරමින් පවතී.<br>තවද, ජූලි වර්ජක ප්‍රතිලාභ ලබාගැනීම සඳහා අයදුම් පත්‍ර ඉදිරිපත් වන සෑම අවස්ථාවකම | 2022 ට පෙර ගෙවන ලද තොරතුරු අනුව දත්ත පද්ධතිය යාවත්කාලීන නොවීම මත ද්විත්ව ගෙවීම් සිදුවීමේ අවධානමක් ඇති බැවින් එම තොරතුරු දත්ත |

| | | | |
|---|---|---|---|
| | කල බව විගණනය වෙත දන්වා තිබුණි. 2022 වර්ෂයට කරන ලද ගෙවීම් අනුව දත්ත පද්ධතිය යාවත්කාලීන කලද 2022 වර්ෂයට පෙර ගෙවීම් කරන ලද ප්‍රතිලාභීන් පිලිබඳ අයවැය දෙපාර්තමේන්තුවෙන් ලබාගත් තොරතුරු අනුව දත්ත පද්ධතිය යාවත්කාලීන නොවීම මත එම පුද්ගලයින් සඳහා නැවත අයදුම්පත් නිර්දේශ කිරීමේ අවධානම තවදුරටත් පැවතුණි. මාණ්ඩලික නිලධාරියෙකු විසින් අයදුම්පතෙහි නිවරද්‍යතාවය පරීක්ෂා කලද දත්ත පද්ධතිය යාවත්කාලීනවීම අධීක්ෂණය කර නොතිබුණි. | පරීක්ෂණ ලැයිස්තුවක් අනුව පරීක්ෂා කරන අතර දත්ත පද්ධතිය හා අයඳුම් පත්‍රය අතර තොරතුරු නිවැරදි ද යන්න සහකාර ලේකම් (ආයතන) මගින් ද පෞද්ගලිකව පරීක්ෂා කරනු ලබයි. එසේ වුවද, එසේ පරීක්ෂා කළ බවට අයඳුම් පත්‍රයේ පිටසන් කිරීමක් සිදු නො‍වන අතර එම දුර්වලතාවය හඳුනා ගැනීම සම්බන්ධයෙන් විගණනය වෙත කෘතඥතාවය පල කරනු ලැබේ. ඒ අනුව, සටහන් පත්‍රයේ එම සුළු දුර්වලතාවය ද නොමැති වන අයුරින් සංශෝධනය කිරීමට පියවර ගැනීමට නියමිතය. | පද්ධතියට ඇතුලත් කලයුතු වීම හා මාණ්ඩලික නිලධාරියෙකුගේ අධීක්ෂණය යටතේ සිදුකල යුතු වීම. |
| (උ) | අම්පාර නිවාඩු නිකේතනය පිහිටි ඉඩම 2022 මැයි මස වන විටද කම්කරු අමාත්‍යාංශය වෙත පවරගෙන නොතිබුණි. | මේ සම්බන්ධව දිගින් දිගටම වන ජීවී සංරක්ෂණ අමාත්‍යාංශයටත් වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවටත් දැනුම් දී ඇති අතර වනජීවී අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ (සංවර්ධන) විසින් මෙම ඉඩම් කොටස අම්පාර අභය භූමියෙන් ඉවත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බවත් එම ක්‍රියාවලිය අවසානයේ මෙම ඉඩම් කොටස කම්කරු අමාත්‍යාංශයට පැවරිය හැකි බවත් දන්වා ඇත. | ආයතනයට අයිතියක් නොමැති ඉඩම්වල ඉදිකිරීම් සිදු නොකල යුතු අතර නිවාඩු නිකේතනය ඉදිකර අවසන් බැවින් ඉඩම පවරා ගැනීම කඩිනමින් කලයුතු වීම. |

## 5. යහපාලනය

--------------

### 5.1 මහජනයා වෙත සේවා ඉටු කිරිම

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 නොවැම්බර් 30 දින වන විට කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය වෙත වාර්තා වී තිබූ අනතුරු අතරින් මාරක අරතුරු 140 ක් හා මාරක නොවන අනතුරු 424 | මාරක හෝ මාරක නොවන අනතුරක් පිළිබඳව කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලයට ඉල්ලීමක් ලැබුණු විට ඒ සඳහා නඩු ගොණුවක් විවෘත කිරීමට අඥා පනත ප්‍රකාරව | වන්දි ආඥා පනතෙහි රෙගුලාසි අනුව කටයුතු කර අදාල මුදල් |

ක් සඳහා වන්දි අයකර දීමේ ක්‍රියාවලිය අවසන්ව නොතිබුණු අතර අනතුර වාර්තා වී වසර 5 ඉක්මවූ මාරක අනතුරු 14 ක් හා මාරක නොවන අනතුරු 29 ක් ද මේ තුල ඇතුලත්ව තිබුණි.

විධිමත් අයදුම්පත්‍රයක් හා වෛද්‍ය වාර්තාවක් ඉදිරිපත් කල යුතු වේ. ඒ අනුව අයදුම්පතෙහි හා වෛද්‍ය වාර්තාවේ අඩුපාඩු තිබෙන අවස්ථාවන්හිදී ඒවා නිවැරදි කර ගන්නා තෙක් මූලික කටයුතු ආරම්භ කිරීම ද ප්‍රමාද විය හැක.

නිවැරදි අයදුම්පත්‍රය හා වෛද්‍ය වාර්තාව ලැබුණු පසු නඩු ගොණුව විවෘත කර සේවා යෝජකගෙන් වාර්තාවක් කැඳවිය යුතුවේ. පනත ප්‍රකාරව එම වාර්තාව ඉදිරිපත් කිරීමට දින **30**ක කාලයක් ලබා දියය යුතු වේ. එම කාලයෙන් පසුව වාර්තාව ඉදිරිපත් නොකරන්නේනම් හෝ අනතුර ප්‍රතික්ෂේප කරන්නේ නම් කම්කරු වන්දි අධිකරණයට යොමු කරනු ලබයි.

කම්කරු වන්දි අධිකරණය, අධිකරණ සේවා කොමිසම මඟින් පත්කරනු ලබන දිසා හා මහේස්ත්‍රාත් බලතල සහිත අතිරේක මහේස්ත්‍රාත්වරයෙකු යටතේ ක්‍රියාත්මක වන අතර ම අධිකරණ ක්‍රියාවලිය සිවිල් නඩු විධාන සංග්‍රහය, අපරාධ නඩු විධාන සංග්‍රහය හා සාක්ෂි ආඥා පනත අනුව දිසා අධිකරණ ක්‍රියාදාමයට අනුව ක්‍රියාත්මක කල යුතු වේ. එම අධිකරණ ක්‍රියාවලියේදී දෙපාර්ශවයේ සාක්ෂි වලට අමතරව වෛද්‍යවරුන් හදිසි මරණ පරීක්ෂකවරුන්, දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුවරු, පොලිස් නිලධාරීන් ආදීන්ද සාක්ෂි සඳහා කැඳවීමට සිදුවන අතර එම නිලධාරීන් නියමිත දිනවල නොපැමිණීම නිසාද දැනට වසර **02** ක පමණ කාලයක සිට පවතින සෞඛ්‍ය නීතිරීති අනුවද අධිකරණ ක්‍රියාවලියේදී ගතවන කාලය පිළිබඳව නිශ්චිත කාලසීමාවක් නියම කිරීමට හැකියාවක් නොමැති කමින්ද ප්‍රමාද

කඩිනමින් ප්‍රතිලාභීන් වෙත ලබාදීමට කටයුතු කලයුතු වීම.

| | | | |
|---|---|---|---|
| | | වීම් සිදු වේ.මෙහි ඉල්ලුම්කරුවන් ආබාධිතව පසුවන බැවින් එක්වරක් හෝ පැමිණීමට නොහැකිවීම මත නඩුව නිෂ්ප්‍රභා නොකරන අතර ඔහුට යුක්තිය ඉෂ්ට වීම පිණිස වාර කීපයක් දින ලබා දෙයි.<br>සේවා යෝජක පළමු දිනයේම බොහෝ දුරට අධිකරණය පැමිණෙන්නේ නැති බැවින් ඔවුන් අධිකරණයට ගෙන්වා ගැනීමට ලියාපදිංචි තැපැල්, පොලීසිය මගින් ග්‍රාමසේවක මගින් නොතීසි භාරදීමට කටයුතු කල යුතුය. එමගින්ද ප්‍රමාද සිදු විය හැක.<br>සාමාන්‍ය තත්ත්වය වන්නේ සේවා යෝජක අනතුර නිතරම ඔවුන්ගේ ක්ෂේත්‍රය තුලදී සිදු නොවූ බවට ප්‍රකාශ කිරීමට නිරන්තරයෙන්ම ප්‍රයන්ත දරයි. ඔවුන්ගේ සාමාන්‍ය ස්ථාවරය වන්නේ එක් සේවකයෙකුට වන්දි ලබා දීමට සිදුවුවහොත් අනිකුත් සේවකයින්ද වන්දි ලබා ගැනීමට කටයුතු කරනු ඇති බවයි. | |
| (ආ) | කම්කරු අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණකගේ 2021 මාර්තු 22 දිනැති වාර්තාවට අනුව කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලයේ අහඹු ලෙස තෝරාගත් වසර 5 ඉක්මවූ ගොනු 10 ක් පරීක්ෂා කිරීමේදී වසර 03 සිට වසර 09 ක් දක්වා වූ කාලයක් පුරාවට නඩු වාර 13 සිට 52 දක්වා වූ වාර ගණනක් කැඳවා තිබූ නමුත් 2021 ජනවාරි වන විටත් විසඳුමක් ලැබී නොතිබුණු බව නිරීක්ෂණය විය.<br>ඒ අනුව වන්දි ඉල්ලුම්පත්‍රයක් ඉදිරිපත් කර වන්දි ලබා ගැනීමට අධික කාලයක් ගතවීමෙන් ලැබෙන වන්දි මුදලින් ලබාගත හැකි ප්‍රතිලාභයද ඔවුන්ට නොලැබී යා හැකි බැවින් වන්දි ලබාදීමේ ක්‍රියාවලියේදී අධික ප්‍රමාදයන් ඇති | මෙම යටතේ දක්වා ඇති සියළු නඩු ගොණු කම්කරු වන්දි උසාවිවල දැනට විභාග වන නඩු වේ. මෙම අධිකරණවල දිසා අධිකරණයක ස්වරූපයෙන් නඩු විභාගයන් පැවැත්විය යුතු අතර ඉල්ලුම්කාර හා වගඋත්තරකාර පාර්ශවයන්ගේ සාක්ෂි විමසීම, ඔවුන්ගේ සාක්ෂිකරුවන්ගේ සාක්ෂි විමසීම, විශේෂ නිලධාරීන්ගේ සාක්ෂි විමසීම හරස් ප්‍රශ්න නැවත ප්‍රශ්න නැගීම, වැනි උසාවි ක්‍රියාදාමයන් නියමාකාරණයෙන් අනුගමනය කල යුතු අතර දෙපර්ශවයටම සමාන අවස්ථාවන්ද ලබාදිය යුතු වේ. ඒ අනුව නඩුවක් සඳහා ගතවන කාලසීමාව නිශ්චිතව දැක්වීමට හැකියාවක් නොමැත. එමෙන්ම නිවැරදි උසාවි ක්‍රියාමාර්ග අනුව නඩු | වන්දි ආඥා පනතෙහි රෙගුලාසි අනුව කටයුතු කර අදාල මුදල් කඩිනමින් ප්‍රතිලාභීන් වෙත ලබාදීමට කටයුතු කලයුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | වීමට හේතුවන කරුණු විමසා බලා නිවැරදි කිරීමට පියවර ගෙන නොතිබුණි. | විමසීම සිදු නොකිරීමෙන් කම්කරු වන්දි උසාවියේ තීන්දුව ඉහල අධිකරණයේදී සංශෝධනයටය ලක් වීමටද ඉඩ ඇත. | |
| (ඇ) | කම්කරු වන්දි උසාවියේ තීරණයන්ට එරෙහිව අභියාචනා කරන ලද ගොනු 13 කට අදාල සේවායෝජක විසින් වන්දි කාර්යාලයේ තැන්පත් කරන ලද රු.4,947,535 ක් සඳහා ඉතිරි කිරීම් ගිණුම් ආරම්භ කර තිබූ අතර මින් රු.3,729,505 ක ඉතිරි කිරීම් තැන්පත් ගිණුම් 10 ක් ආරම්භ කර වසර 1 ත් 4 ත් අතර කාලයක් ගතවී තිබුණි. | අභියාචනා කරන ලද නඩු ගොණු සම්බන්ධව ඉහල අධිකරණයේ නියෝග ලැබෙනතෙක් ඒ සම්බන්ධ ක්‍රියාමාර්ග ගැනීමට නොහැකි වේ. | වන්දි ආඥා පනතෙහි රෙගුලාසි අනුව කටයුතු කර අදාල මුදල් කඩිනමින් ප්‍රතිලාභීන් වෙත ලබාදීමට කටයුතු කලයුතු වීම. |
| (ඈ) | රැකියාවේ යෙදී සිටියදී සිදුවන මාරක අනතුරු හේතුවෙන් මියයන සේවකයින්ගේ බාලවයස්කාර දරුවන්ට හිමිවන වන්දි මුදල් ඔවුන් වයස් පූර්ණත්වයට පත්වන තෙක් ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ වන්දි කොමසාරිස් නමින් වූ ස්ථාවර තැන්පතුවක ආයෝජනය කර වයස් පූර්ණත්වයට පත්වූ පසු ඔවුන් වෙත නිදහස් කිරීම සිදුකල යුතු වුවද 2021 දෙසැම්බර් 20 වන විට පැවති එලෙස වයස් පූර්ණත්වයට පත්ව නිදහස් නොකල ස්ථාවර තැන්පතුවල වටිනාකම රු.6,100,788 ක් විය. | 2022 ජුනි 08 දින වන විට පවතින ශේෂය රු.1,075,000.00 ක් වේ. | කඩිනමින් වන්දි මුදල් නිදහස් කිරීමට කටයුතු කලයුතු වීම. |
| (ඉ) | අගතියට පත් පාර්ශවය සඳහා හිමිවිය යුතු බවට වන්දි උසාවියේදී තීරණය වුවද නඩු නියෝගය අනුව සේවායෝජක වන්දි මුදල නොගෙවීම හේතුවෙන් 2021 දෙසැම්බර් 31 දින වන විට නඩු 46 ක් වරෙන්තු වශයෙන් පැවති අතර එමගින් හිමිවිය යුතු වන්දි මුදල රු.13,419,197 ක් විය. මේ අතර වරෙන්තු නිකුත් කර වසර 10 ක් ඉක්ම වූ නඩු 10 කට අදාල රු.1,873,352 ක් ද වසර 5 – 10 ත් අතර නඩු 21 කට අදාල රු.6,917,546 ක් හා අවුරුදු 1 – 4 | කම්කරු වන්දි උසාවියේ තීන්දුව මත වන්දි මුදල නොගෙවෙන අවස්ථාවලදී වගඋත්තරකරුගේ චංචල දේපල තහනමට ගෙන අයකර ගැනීමේ ක්‍රියාවලිය අදාල මහේස්ත්‍රාත් උසාවිය මඟින් ක්‍රියාත්මක කර ගැනීම සඳහා අගතියටපත් පාර්ශවය ඉදිරිපත් විය යුතු අතර ඔවුන් ඒ සඳහා සහයෝගය නොදැක්වීම මත මෙම මුදල් අයකර ගැනීම ප්‍රමාද වෙමින් ඇත.<br><br>මෙම තත්ත්වය නිරවුල් කර ගැනීම සඳහා අධිකරණ සේවා කොමිසම | වන්දි ආඥා පනතෙහි රෙගුලාසි අනුව කටයුතු කර අදාල ප්‍රතිලාභීන් වෙත කඩිනමින් මුදල් ලබාදීමට කටයුතු කලයුතු වීම. |

| | | |
|---|---|---|
| අතර නඩු 15 කට අදාල රු.4,628,298 ක් ද ඇතුලත් විය. මේ ආකාරයට වන්දි උසාවිය මගින් තීරණය වුවද වන්දිලාභියාට මෙම මුදල නොලැබීම මත වන්දි කොමසාරිස් කාර්යාලයේ අරමුණු ඉටු වී නොතිබුණි. | මඟින් කම්කරු වන්දි අධිකරණයට රෙජිස්ට්‍රාර්වරයෙකු පත්කර ගැනීමටත්, වගඋත්තරකරුගේ නිශ්චල දේපළ තහනමට ගත හැකි ලෙස පනත සංශෝධනයට ඇතුලත්කර ඇති බැවින් ඉදිරියේදී මෙම ගැටළුව නිරවුල්කර ගැනීමටද හැකිවනු ඇත. | |

**6.** **මානව සම්පත් කළමනාකරණය**

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) වන්දි කොමසාරිස් කාර්යාලයේ අනුමත කාර්ය මණ්ඩල තුල අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන අධිකරණ නිලධාරීන් වන කම්කරු වන්දි කොමසාරිස්, අතිරේක කම්කරු වන්දි කොමසාරිස් හා නියෝජ්‍ය කම්කරු වන්දි කොමසාරිස් යන තනතුරු 3 ක් හා සහකාර කම්කරු කොමසාරිස් තනතුරු 1 ක් ඇතුලත්ව තිබූ නමුත් දීර්ඝ කාලයක සිට මින් තනතුරු 3 ක්ම පුරප්පාඩුව පැවතුණි. වන්දි නඩුවක් උසාවියට කැඳවීමට දීර්ඝ කාලයක් ගතවී තිබුණු අතර දිවයින පුරා පිහිටි කම්කරු උසාවි 14 ක වන්දි නඩු විභාග කිරීම එක් විනිශ්චයකාර වරෙයෙකු විසින් සිදුකිරීමද මෙයට හේතුවී තිබිය හැකිය. නිදසුනක් ලෙස කොළඹ කලාපය තුල පමණක් වාර්තා වී තිබූ මාරක අනතුරු අතරින් තීන්දුවක් නොලද, අවසන්වරට උසාවි කැඳවා වසර 2 සිට වසර 7 දක්වා කාලයක් ගත වී තිබූ ලිපිගොනු 26 ක් නිරීක්ෂණය විය. | පුරප්පාඩු තනතුර පිළිබඳව අප විසින් කම්කරු අමාත්‍යාංශය, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත කාර්තුමය හා වාර්ෂිකව දැනුවත් කිරීම සිදුකර ඇත. අතිරේක කම්කරු වන්දි කෙමාසාරිස් තනතුරේ රාජකාරී කටයුතු නැවත දැනුම්දෙනතුරු කම්කරු වන්දි කොමසාරිස් මඟින් ඉටුකල යුතු බව අධිකරණ සේවා කොමිසම මඟින් නියමකර ඇත. ඔබ සඳහන් කර ඇති නඩු ගොණු අක්‍රීයව ඇති ගොණු නොව උසාවියේ විභාගවන නඩු ගොණු වේ. | වන්දි කොමසාරිස් කාර්යාලය පිහිටුවීමේ අරමුන ප්‍රශස්ථ ලෙස ඉටු කිරීමට අවශ්‍ය මානව සම්පත් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු කලයුතු වීම. |

(ආ) 2021 වර්ෂයේදී කම්කරු අමාත්‍යාංශයේ පුද්ගල පඩිනඩි සඳහා රු.483,931,657 ක් වැය වී තිබූ අතර අනුමත හා තත්‍ය කාර්ය මණ්ඩලය පිලිබඳ විස්තර පහත දැක්වේ.

| **සේවක වර්ගය** | **අනුමත සේවක සංඛ්‍යාව** | **තථ්‍ය සේවක සංඛ්‍යාව** | **පුරප්පාඩු සංඛ්‍යාව** |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 45 | 22 | 23 |
| තෘතියික මට්ටම | 10 | 06 | 04 |
| ද්විතියික මට්ටම | 897 | 783 | 114 |
| ප්‍රාථමික මට්ටම | 57 | 32 | 25 |
| **එකතුව** | **1,009** | **843** | **166** |

ජ්‍යෙෂ්ඨ තෘතීක හා ද්වීතීක මට්ටම් වලට අදාල බඳවා ගැනීම් මෙම අමාත්‍යාංශය මඟින් සිදු නොවන අතර අදාල ආයතන වෙත පුරප්පාඩු පුරවන ලෙස දැනුම් දීම සිදු කර ඇත. ඒ අනුව, උපාධිධාරීන් බඳවා ගැනීමේ වැඩසටහන යටතේ බඳවාගත් උපාධිධාරී අභ්‍යාසලාභීන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් මෙම අමාත්‍යාංශය වෙත ලබා දී ඇති හෙයින් ද්වීතීක මට්ටමේ පුරප්පාඩු පුරවා ඇත.
බඳවා ගැනීම් සම්බන්ධයෙන් ජනාධිපති ලේකම් කාර්යාලය විසින් නිකුත් කර ඇති චක්‍රලේඛයට අනුව පුරප්පාඩු පිරවීම අත්හිටුවා ඇති හෙයින් බහුකාර්යය සංවර්ධන කාර්යසාධක බලකාය වෙතින් සේවකයින් ගෙන්වා ගැනීමට කටයුතු කර ඇත.

අමාත්‍යාංශයේ අපේක්ෂිත කාර්යභාරය වඩාත් කාර්යක්ෂමව ක්‍රියාවේ යෙදවීමට අවශ්‍ය මානව සම්පත ප්‍රශස්ථව පවත්වාගෙන යාමට අමාත්‍යාංශය කටයුතු කලයුතු වීම.